# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2453/21 - 2025 සැප්තැම්බර් මස 10 වැනි බදාදා - 2025.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : මහ/ඉ/අත්/378.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 496 කොට්ටාව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොට්ටාව ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 521416 හි කලාප අංක 3 පත්‍ර අංක 1 හි පෙන්නුම්කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.9266 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැලි :

01. කැබලි අංක **01**
ඉඩමේ නම: ගල්කන්දවෙල; ඉඩමේ විස්තරය : කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 1.7687.

02. කැබලි අංක **02**
ඉඩමේ නම: ගල්කන්දවෙල; ඉඩමේ විස්තරය : ඕවිට, ගරා වැටුන ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1579.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 ඔක්තෝබර් මස 22 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

හිරිපිටියගේ රංජිකා හිමාලි කරුණාරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2025 අගෝස්තු මස 29 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

EOG 09 - 0083


1A - G 045331 – 14 (2025/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*